# දාගැබ් නිර්මාණ සම්ප්‍රදායෙන් වෙනස් වූ කොටවෙහෙර සම්ප්‍රදාය

එස්.එම්. ප්‍රසන්න ප්‍රදීප් කුමාර

පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
*prasannapradeep93@gmail.com*

ප්‍රමුඛ පදඃ කොටවෙහෙර, චෛත්‍ය ආකෘතිය, නිර්මාණ තාක්ෂණය, සාම්ප්‍රදායික

## හැඳින්වීම

මෙරට ස්තූප නිර්මාණ තාක්ෂණයේ සුවිශේෂ අවස්ථාවක් වන කොටවෙහෙර නිර්මාණ සම්ප්‍රදාය බිහිවන්නේ පරාක්‍රමබාහු රජ සමයේදී ය. නමුත් පැවති සම්ප්‍රදායික ස්තූප ආකෘතියෙන් ඔබ්බට වූ එම නවමු ආකෘතිය විකාශය වීමක් හෝ වර්ධනයක් මෙරට ස්තූප කලාවෙහි ලා හඳුනාගත නොහැකිය. ඒ එසේ වූයේ කුමන පදනමකින්ද යන්න ගැටලුවකි.

කෙසේ වුවද කොටවෙහෙර සම්ප්‍රදාය වූ කල්හි මෙරට ස්තූප තාක්ෂණයෙහි ලා නවමු අත්හදා බැලීමකි. ආකෘතිමය අතින් එය සුවිශේෂිය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වූයේ මතභේදයට ලක්ව ඇති කොටවෙහෙර සම්ප්‍රදායට අයත් චෛත්‍ය ආකෘතියේ සැබෑ ස්වරූපය හඳුනාගැනීම හා එකී ආකෘතිය ස්තූප නිර්මාණකරනයෙහිලා විකාශනය නොවූයේ කුමන හේතු කාරණා නිසාද යන්න සොයා බැලීමයි. අවශේෂ අරමුණු අතර කොටවෙහෙර නිර්මාණ සම්ප්‍රදායට අයත් ස්තූප තාක්ෂණය අනාවරණය කර ගැනීම ද විය.

කොටවෙහෙර සම්ප්‍රදාය මෙරට ස්තූප තාක්ෂණයේ අංකුර අවස්ථාවක් හෝ අග්‍ර අවස්ථාවක් නොවේ. එය මෙරට ස්තූප විකාශනයේ අතරමැද ඉතාම කෙටි කලක් නියෝජනය කරන අතිශය සීමිත නිර්මාණ ප්‍රමාණයකින් යුතු සම්ප්‍රදායකි. නමුත් එය පෞරාණිකත්වයෙහි ලා සමාජ, ආර්ථික, තාක්ෂණික, ආගමික, යන විවිධ අංශයන්ගෙන් සුවිශේෂ වේ. බොහෝවිට මෙම සම්ප්‍රදාය පැරකුම් යුගය සමග ඍජු සබඳතා දක්වයි.

කොටවෙහෙර සම්ප්‍රදායේ මූලිකම ලක්ෂණය නම් මෙම චෛත්‍ය ආකෘතිය දෙමහල් ස්වරූපයක් ගැනීමයි. එය අඩක් නිමකල ධාතු ගර්භයක් වැනි ගොඩැල්ලක් මත ඉදිකළ තවත් ස්තූපයකින් යුතු නව ආකෘතියකි. මෙම සම්ප්‍රදායට අයත් යැයි හඳුනාගෙන තිබෙන චෛත්‍ය කිහිපයම මෙම ලක්ෂණය මැනවින් පෙන්නුම් කරයි. ඇතමුන් මෙම ආකෘතිය අඩක් නිමකළ ස්තූප ලෙසින් හඳුනාගත් බැවින් සමහර විට මේ සඳහා "කොටවෙහෙර" යන නාමය ආදේශ කරන්නට ඇතැයි අනුමාන කළ හැකිය. නමුත් පුරාවිද්‍යාත්මක කැණීම් මගින් එම තර්කය බිඳහෙලා එහි සැබෑ නිර්මාණ ආකෘතිය අනාවරණය කරගෙන තිබේ. මෙම පර්යේෂණයේ දී සිදුකළ තුලනාත්මක අධ්‍යයනයේ දී මෙම ආකෘතිය කිසිසේත්ම අඩක් නිම කළ චෛත්‍ය හැටියට ගත නොහැකි බව සනාථ විය. කෙසේ වුවද, මෙරට චෛත්‍ය ආකෘතිය විකාශනය පිළිබඳව විමසා බැලීමේදී වර්තමාන චෛත්‍යයන්හි උපරිභාගයට අයත් කොටස මුල්ම යුගයේදී හර්මිකාව, යූපය, හා ඡත්‍රාවලිය යන අංග ලක්ෂණවලින් යුක්තව තිබූ බවට සාක්ෂි තිබේ. ඒ හැරුණු විට ආකෘතියෙහිලා ස්ථාවර වූ සැලකිය යුතු වෙනසක් හඳුනාගැනීම අපහසු ය. මෙකී පර්යේෂණය සාක්ෂාත් කරගැනීම උදෙසා කොටවෙහෙර සම්ප්‍රදායට අයත් චෛත්‍ය කිහිපයක්

පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයක යෙදීමට සිදුවිය. එහිදි ප්‍රධාන වශයෙන්

- දැදිගම කොටවෙහෙර
- පොළොන්නරු දෙමළ මහා සෑය
- යුධගනාව සූතිඝර චෛත්‍යය

පිළිබඳ අධ්‍යයනයට ලක් කෙරිණි.

**ක්‍රමවේදය**

පූර්ව අධ්‍යයනයේ දී මූලික ලෙසම ශාස්ත්‍රිය පොත පත කෙරෙහි අවදානය යොමු කළ අතර ඒ හරහා රැස්කරගත් තොරතුරු මත අධයනය පෘථුල කර ගැනිම උදෙසා ක්ෂේත්‍රය වෙත එළඹ රැස්කරගත් දත්ත ඉතා වැදගත් විය.

එහිදි අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස ශ්‍රි ලංකාවේ උතුරුමැද පළාතට අයත් පොළොන්නරු දිස්ත්‍රිකයේ පිහිටා තිබෙන දෙමළ මහා සෑය ද කෑගල්ල දිස්ත්‍රිකයට අයත් දෑදිගම කොටවෙහෙර ද යොදා ගැනිණි. එහිදී දත්ත එක්රැස්කර ගැනීම සඳහා ක්ෂේත්‍ර සමික්ෂණ ක්‍රමවේදය සහ අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිතව මෙතෙක් සිදුකර ඇති ස්තරවිද්‍යානුකුල කැනිම් මගින් හඳුනාගත් තොරතුරු අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදි. අධ්‍යයනයට බඳුන්කරන ලද කොටවෙහෙර සම්ප්‍රදායේ දාගැබ් තුන පිළිබඳව හඳුනාගත් තොරතුරු සමඟ ශ්‍රි ලංකාවේ බහුලව පවතින අනෙක් ස්ථූප නිර්මාණ සම්ප්‍රදායන්ගේ පවතින ලක්ෂණ සමඟ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුකරන ලදි. දත්ත එක්රැස්කිරිමෙන් අනතුරුව අධ්‍යයනයේ අරමුණුවලට අදාලව දත්ත විශ්ලේෂණයකර අදාළ ප්‍රතිඵල ලබා ගන්නා ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

කොටවෙහෙර සම්ප්‍රදායට අයත් චෛත්‍ය ත්‍රිත්වය අධ්‍යයනයේ දි අනාවරණය කරගත් කරුණු කිහිපයක් පරාක්‍රමබාහු රජු සමඟ සමීප සබඳතා දක්වන බව අධ්‍යයනයේ දී හඳුනා ගැනිණි. එනම්,

- මෙම චෛත්‍ය ත්‍රිත්වයම පොළොන්නරු රාජ්‍ය සමයේ පාලකයකු වූ මහා පරාක්‍රමබාහු රජුගේ අනුග්‍රහයෙන් නිර්මාණය වූ බව.
- මෙම ස්ථූප ත්‍රිත්වයම ආගමික අවශ්‍යතා මතින් බැහැරව පෞද්ගලික ස්මාරක ලෙස ඉදිවීම හා ඒවටා පසු කාලිනව ආගමික වටිනාකමක් ලබාදී තිබෙන බව.
- මෙම ස්ථූප ත්‍රිත්වයම සිතා හෝ නොසිතා රුහුණු, පිහිටි, මායා, යන ඉපැරණි බෙදීම්වල පිළිවලින් රත්නාවලි සෑය, දෙමළ මහ සෑය, හා සූතිඝර සෑය ලෙස ඉදිකර තිබෙන බව.

යනාදියයි. තුන් මහල් පේසාවක් ඉදිකර ඒ මත අඩක් නිම කළ ගර්භය මත සමතලා ගඩොල් අතුරා ඒ මත නැවත කුඩා ස්ථූපයක් නිර්මාණය කර එම ස්ථූපයේ ද පේසාව ගර්භය ආදි මූලිකාංග ස්ථාපනය කර තිබෙන බව මෙම සම්ප්‍රදායට අයත් වෙහෙර අධ්‍යයනයෙන් හඳුනාගත හැකිය. විශේෂත්වය වන්නේ දෑදිගම කොටවෙහෙරට අදාලව නිම්න බිමක කඳු ගැටයක් හා දෙමළ මහා සෑයට අදාලව තිරිවානා කන්දක් මැදිකර මෙම චෛත්‍ය නිර්මාණය කර තිබීමයි.

1943 දෑදිගම කොටවෙහෙරට අදාල කැනිම් වලින් ලොව විශ්මිත කළ තාක්ෂණයක් අනාවරණය කර ගැනිමට පුරාවිද්‍යාඥන් සමත් විය. ඒ නිධන් තැන්පත් කිරීමෙන් අනතුරුව ඊට වාතය ඇතුලු විම වැලැක්විම සදහා නිදන් කොටුව ඇතුලේ පොල් තෙල් පහන් පත්තුකර නිධන් කොටුව වසා දැමීමයි. එය එක්තරා මුද්‍රා තැබිමකට සමානය. මළ බැදිම වැළකෙන්නේ මළ බැදිමේ රසායනික ප්‍රතික්‍රියාවන්ට අවශ්‍ය

සංඝටකයක් වන ඔක්සිජන් නොමැතිකමිණි. මෙය ඉපැරණි ඊජිප්තුවේ පිරමීඩ තාක්ෂණය ට සමානය.

දෙමළ මහා සෑය මත වටකුරු මාලකයහි පුරාවිද්‍යාත්මක කැනීමක් සිදුකර ඇති අතර ඉන් තිරුවානා කන්දක් මැදිකිරීමෙන් මෙම ස්ථූපය ගොඩනගා ඇති බවට අනාවරණය වූ බව මහාචාර්ය පී.එල්. ප්‍රේමතිලක මහතා දක්වා තිබේ.අනතුරුව 1983 දී කාර්තු 04කට බෙදා එක් කාර්තුවක් කොටස් 32 කට බෙදාගන කැනීම් කටයුතු කර තිබේ. දෙමළ මහා සෑයේ එකී පූර්ව කැණීම් තුළින් හෙළිවූ වැදගත් කරුණු අතර සෑය බැඳීමට බාහිරින් ගෙනෙන ලද පස් යොදාගන තිබෙන බව ද ස්ථූපය වටා ඇති හැම ගඩොල් බැම්මක්ම පිහිටි ගලේ සිට බැද තිබෙන බවද ස්ථූපයේ හැඩය මතුකර ගැනීම සඳහා තිරුවානා කන්ද කපා හැඩගන්වා තිබෙන බව ද අනාවරණය වී තිබේ.

තාක්ෂණික සහ කලාත්මක අතින් ඉහත නිර්මාණශීලීත්වය පෙන්නුම් කළ ද සම්ප්‍රදායික චෛත්‍ය ආකෘතියේ පැවති ගාම්භීර බව හා කලාත්මක බව පරාජය කර නව කොටවෙහෙර සම්ප්‍රදාය ජනානුගත වීමට හැකියාවක් ලබා නොගන්නේ මක් නිසාද යන කාරණය ගැටළුවකි. පැවති සම්ප්‍රදායික චෛත්‍ය ආකෘතියේ අංග කෙරෙන් සංකේතාත්මක අගයක් නිරූපණය වන බව විද්වතුන්ගේ මතයකි. පේසාවළලු වලින් ත්‍රිවිධරත්නය ද ධාතු ගර්භයෙන් ධර්මස්කන්දය ද දේවතා කොටුවේ සතර දිගින් චතුරාර්ය සත්‍ය ද කොත් කැරැල්ලෙන් ආර්ය අෂ්ඨාංගික මාර්ගය ද චූඩා මානික්‍යයෙන් උතුම් නිර්වාණය ද ඒ අනුව සංකේතවත් වේ. නමුත් කොටවෙහෙර සම්ප්‍රදාය දුවැන්ත වූවත් කලාත්මක අතින් පැවති සම්ප්‍රදායට වඩා පසුගාමී බව අනුමාන කළ හැක. එසේම පැවති ආකෘතියේ සරල බව ද මෙම ආකෘතිය තුළ දක්නට නොලැබිණි. එපමනක් නොව බුදුරජාණන් වහන්සේ චෛත්‍යය නිර්මාණය කිරීම පිළිබඳව ආකෘතිය පැහැදිළි කිරීමේදී පෙන්වාදුන් ආකෘතියෙන් ද කොට වෙහෙර බැහැර බව කිව යුතුය.

මීට අමතරව චෛත්‍ය ආකෘතිය මගින් බුදුන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ සංකේතවත් වන බව පොදු පිළිගැනීමකි. කොටවෙහෙර සම්ප්‍රදායේ ආකෘතිමය ස්වාභාවය මෙකී මහා පුරුෂ ලක්ෂණ නියෝජනය කෙරෙහි නිසැක අඩුපාඩු දක්වන්නට ඇත. එහෙයින් මෙම සම්ප්‍රදාය ජනානුගත නොවීම කෙරෙහි එකී සාධක ප්‍රබල ලෙස බලපාන්නට ඇත.

### ආශ්‍රිත ග්‍රන්ථ


යටවර, එම්.බී.එම්.එස්. (2001) ***අසිරිමත් දැදිගම සහ රජමහා වෙහෙර.*** ප්‍රථම මුද්‍රණය. දර්ශන ග්‍රැෆික්ස් කෑගල්ල.

ලගමුව, ආරිය (2002) ***පොළොන්නරුව.*** සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.